# Abstract No 87

## මාධ්‍යමික සාපේක්ෂතාව ගොඩනැගී ඇති ආකාරය පිළිබඳ විමසුමක්.

**පූජ්‍ය හක්මණ සරණවංශ හිමි**
ශාසත්‍රවේදී (විශේෂ),දෙවනවසර,පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය,කැලණිය විශ්වවිද්‍යාලය
hsaranawansa@gmail.com

බුදුදහමේ දර්ශනය සෙවූ පසුකාලීන ආචාර්යවරයෝ නොයෙක් මත ඒ පිළිබඳ පළ කළහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් මහායාන යැයි එක කොටසක් වෙන් වූ අතර අනෙක හීනයාන වශයෙන් හැඳින්විණ. මින් මහායාන දර්ශනයෙහි ආදිකතෘ වූ නාගර්ජුන ආචාර්යපාදයෝ මාධ්‍යමික දර්ශනය උපයෝගී කොට ගනිමින් මහායානය සංවර්ධනය කළහ. මහායානික සෑම ආගමික චින්තන සම්ප්‍රදායක් කෙරෙහි ම මෙම මාධ්‍යමික චින්තනයෙහි බලපෑම් දක්නට ලැබේ. එය එක්තරා ආකාරයක සංවර්ධිත සම්ප්‍රදායක මූලික ලක්ෂණ පෙන්නුම් කරන්නකි. මෙහි දී විමසීමට ලක්වන සාපේක්ෂතාව නූතන වියතුන් සලකන්නේ ඇල්බට් අයිස්ටයින් නම් මහා දාර්ශනිකයාණන් ඉදිරිපත් කළ දර්ශනයක් ලෙසට ය. නමුත් මෙහි නියම හිමිකරුවා වන්නේ ක්‍රි.ව 150 පමණ ජීවත් වු නාගාර්ජුන හිමියෝ ය. ඒ වගට සාධක මාධ්‍යමික දර්ශනය හැදෑරීමෙන් උගත හැකි ය. මාධ්‍යමික දර්ශනය ඉතා ගැඹුරු තර්ක ක්‍රමයක් මත ගොඩනැගී ඇත. එක්තරා අන්දමක අපෝහකවාදයක් සේ දැක්විය හැකි මෙම තර්ක ක්‍රමය හේතු කොටගෙන මාධ්‍යමික දර්ශනය ඉතාමත් බුද්ධිගෝචර තර්කයට සම්බන්ධ වූ දර්ශනයක් ලෙසින් හඳුන්වාදිය හැකි ය. මෙසේ තාර්කික රීතින් මත ගොඩනගන ලද මාධ්‍යමික දර්ශනයෙන් ඔවුන් ඔප්පු කිරීමට උත්සාහ ගෙන ඇත්තේ මිනිස් ජීවිතයෙහි පවත්නා ශූන්‍යත්වය ඔප්පු කිරීම පමණි. මිනිස් චින්තනයෙහි දක්නට ලැබෙන නිසරු බව මිනිසුන් විසින් භාවිත කරනු ලබන සංකල්පයන්ගේ සාපේක්ෂතාව ගෙන හැර දැක්වීමෙන් පැහැදිලි කිරීමට ප්‍රයත්න දරා ඇත. මිනිසා විසින් භාවිත කරනු ලබන සංකල්පයන් පිළිබඳ ව ඔහු සිතනුයේ ඒවාට උරුම වූ ස්වාධීන අදහසක් පවත්නා බව ය. නමුත් සෑම සංකල්පයක ම අර්ථය රඳා පවතිනුයේ සාපේක්ෂ ආකාරයකිනි. ඒ සිද්ධාන්තය ම ශූන්‍යතාව කෙරෙහි යොදා ගනිමින් අබෞද්ධයින් ශූන්‍යතාවාදය හෑල්ලුවට ලක් කිරීම වැළැක්වීමට උපයෝගී කරගත් අයුරු මෙම සාපේක්ෂතාව තුළින් දත හැකි ය. පූර්වෝක්ත සාපේක්ෂතාව පිළිබඳ ව හා එය ගොඩනැගුන ආකාරය මෙන් ම මාධ්‍යමික දර්ශනය කෙරෙහි බලපෑ ආකාරය ඒ සඳහා අවැසි මූලාශ්‍රයන් උපයෝගී කර ගනිමින් මෙය විමර්ශනය ලක් කිරීම මූලික අරමුණ යි.

**ප්‍රමුඛපද-** මාධ්‍යමික, සාපේක්ෂතාව, අපෝහකවාදය, ශූන්‍යතාවාදය